# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/12 - 2021 දෙසැම්බර් මස 21 වැනි අඟහරුවාදා - 2021.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

### 2022/2023/2024 තෙවර්ෂය සඳහා නිල ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම

''සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිගෙන ඇති පරිදි ජනමාධ්‍ය ආයතනවල හා ජනමාධ්‍ය වෘත්තිකයන්ගේ කාර්යභාරය මනාව ඉටුකිරීමට අවශ්‍ය නිදහස් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම රජයේ වගකීමකි. ඊට අනුගතව යහපත් හා ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් වෙනුවෙන් කැපවී සිටින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට නිල ජනමාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනුයේ ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මක බව වර්ධනය කරමින් ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමත්, ස්වකීය මාධ්‍ය මෙහෙවර බාධාවකින් තොරව කරගෙන යාමට සහයවීමත් පිණිසය.

මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යයේදී, ප්‍රවෘත්ති හා තොරතුරු රැස්කරන, රචනා කරන, සංස්කරණය කරන, සපයාගත් තොරතුරු මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් මාධ්‍ය ඔස්සේ ග්‍රාහකයා වෙත සන්නිවේදනය කරන තැනැත්තා ප්‍රවෘත්ති කලාවේදියකු/ජනමාධ්‍යවේදියකු ලෙස සලකනු ලැබේ. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ එම කර්තව්‍යයේ නිරත වෘත්තීය ජන මාධ්‍යවේදීන්ට පමණි.

මාධ්‍ය හැඳුනුම්පත අයැදුම් කිරීමේදී වෘත්තීය ජනමාධ්‍යවේදීන් පමණක් නිර්දේශ කරන මෙන් සියලුම මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් මාධ්‍ය ආයතන ප්‍රධානීන්ගෙන් සහ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු අංශ ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මාධ්‍ය හැඳුනුම්පත ලබාගැනීම සඳහා මාධ්‍ය ආයතන ඉදිරිපත් කරන නාමලේඛනය හා එහි ඇතුළත් තොරතුරු පිළිබඳ පූර්ණ වගකීම එය සහතික කරන මාධ්‍ය ආයතන ප්‍රධානියා/ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක හෝ අදාළ මාධ්‍ය ආයතනයේ බලධාරියා වෙත පැවරේ.

2022/2023/2024 තෙවර්ෂය සඳහා පහත සඳහන් වර්ගීකරණ යටතේ මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරන අතර, ඒ සඳහා අවශ්‍ය මතු දැක්වෙන ලිපි ලේඛන හා නිර්ණායක කෙරෙහි අදාළ පාර්ශ්වයන්ගේ අවධානය යොමු කරවමි.

1. මාණ්ඩලික මාධ්‍යවේදී (Journalist)
2. ප්‍රාදේශීය මාධ්‍යවේදී (Provincial Journalist)
3. නිදහස් මාධ්‍යවේදී (Freelance Journalist)
4. විදේශීය මාධ්‍යවේදී (තාවකාලික) (Foreign Journalist) - (Temporary)
5. මාධ්‍ය පරිපාලක (Media Administrator)
6. තාක්ෂණික ශිල්පී (Technical)
7. රාජ්‍ය මාධ්‍ය නිලධාරි (Media official)
8. මාධ්‍ය සේවා (Media services)


1A - G 35623 — 20 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**01. මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපි ලේඛන**

i. 2022/2023/2024 යන තෙවර්ෂය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දක්වා වලංගු වන පරිදි මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

ii. පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනම මත ජනමාධ්‍යවේදියකු ලෙස අවම වශයෙන් මාස 06 කට වැඩි කාලයක් සේවයේ නිරතව සිටිය යුතුය. (අභ්‍යාසලාභීන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.)

iii. අදාළ මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය පහත දැක්වෙන ආකෘතියට අනුව සකස්කර මාධ්‍ය හැඳුනුම්පත් ලබාදෙන ලෙස, කෙරෙන ඉල්ලීම් ලිපිය හා නාමලේඛනය ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය නම, තනතුර, අත්සන සමග නිල මුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | නම | ජා.හැ. අංකය | තනතුර | සේවය කරන අංශය |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |

iv. මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම ඇතුළත් ලිපිය සහතික කරන තැනැත්තා නාම ලේඛනයේ සෑම පිටුවකම සිය අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය.

v. නාම ලේඛනයේ සඳහන් තනතුර තහවුරු කරනු පිණිස මාධ්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යාලයීය හැඳුනුම් පතෙහි ඡායා පිටපතක්, නාම ලේඛනය සහතික කරන තැනැත්තා විසින් සිය නම, තනතුර හා අත්සන සමග නිල මුද්‍රාව තබා සත්‍ය පිටපතක් බවට සහතික කළ යුතුය.

vi. කාර්යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවක දී අයැදුම්කරුගේ පත්වීම් ලිපියෙහි පිටපතක් නාම ලේඛනය සහතික කරනු ලබන තැනැත්තා විසින් නම, තනතුර, අත්සන සමග නිලමුද්‍රාව තබා සහතික කර ඉදිරිපත් කළ යුතුය.

vii. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dgi.gov.lk) හෝ රජයේ නිල පුවත් වෙබ් අඩවිය (www.news.lk) හෝ වෙතින් 2022/2023/2024 තෙවර්ෂයට අදාළ අයැදුම්පත් බාගත යුතුය.

viii. සමස්ත නාමලේඛනයට අමතරව, වෙන් වෙන් වශයෙන් සෑම අයැදුම්පතක්ම මාධ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති කළමනාකරු/ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය අත්සන හා නිලමුද්‍රාව තබා සහතික කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

ix. මාස 06ක කාලයක් ඇතුළත ලබාගත් අඟල් 1x1 1/2 (සෙ.මී. 2.6 x සෙ.මී. 3.7) ප්‍රමාණයේ පැහැදිලි වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. නියමිත ප්‍රමාණයට නැති ඡායාරූප හා අපැහැදිලි ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබීම අනිවාර්ය වේ.

x. වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

- ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා කරන වෙබ් අඩවිවල සේවයේ නිරත මාධ්‍යවේදීන්ට පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.
- අදාළ වෙබ් අඩවිය 2022 වසර වෙනුවෙන් ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබිය යුතු අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂයය භාර මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් වෙබ් මාධ්‍යවේදී අයැදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යාංශයෙන් ලැබුණු, වෙබ් අඩවි ලියාපදිංචි සහතිකය පමණක් මාධ්‍ය හැඳුනුම්පත් සඳහා හිමිකම් කීමට ප්‍රමාණවත් කොන්දේසියක් නොවේ.
- වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී අදාළ වෙබ් අඩවියේ සක්‍රීය බව, අරමුණු, ග්‍රාහක සංඛ්‍යාව (Numbers & hits) හා දිනපතා යාවත්කාලීන කිරීම් යන කරුණු කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත.
- මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කරන සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියකටම මාධ්‍ය ආයතනයක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය (Business Registration) තිබිය යුතු අතර, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාරය ලියාපදිංචිය හිමි ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් ස්වකීය නම, අත්සන හා නිල මුද්‍රාව සහිතව එය සහතික කළ යුතුය.
- මාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම පිණිස වෙබ් මාධ්‍යවේදීන් ඉදිරිපත් කරන යම් අයැදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කර ගැනීම අවශ්‍ය බවට හැඟීයන අවස්ථාවන්හිදී, එම අයැදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, වාර්තා ලබාගැනීමෙන් අනතුරුව පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම තීරණය කරනු ලැබේ.
- මාධ්‍ය හැඳුනුම්පත් ලැබීම සඳහා අවම මාස හයක කාලයක්, දෛනිකව හා අඛණ්ඩව යාවත්කාලීන කරනු ලැබූ වෙබ් අඩවියක් බව සනාථ කළ යුතුය. වෙබ් අඩවියේ පළ කෙරෙන වර්තා අතුරින් අවම 35%ක අන්තර්ගතය අනිවාර්යෙන්ම ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු විය යුතුය.

- එක් භාෂා මාධ්‍යයක් වෙනුවෙන් නිකුත් කෙරෙන මාධ්‍ය හැඳුනුම්පත් සංඛ්‍යාව උපරිම 02 කි.
- වෙබ් ජනමාධ්‍යවේදීන්ට පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරන අතර වෙබ් සභාපති/වෙබ් අඩවි පාලක/ගවනර්/පරිපාලන අධ්‍යක්ෂ වැනි පරිබාහිර තනතුරු සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.
- වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ සෘජුවම ප්‍රවෘත්ති වෙබ් අඩවි සඳහා පමණකි. ආයතනික වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

xi. විදේශ මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

- ජාත්‍යන්තරව පිළිගත් විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකාවේ නියෝජිතයන්/වාර්තාකරුවන් ලෙස එම ආයතන විසින් පත්කරනු ලැබ, ස්ථිර වශයෙන්ම අදාළ මාධ්‍ය ආයතනයේ සේවය කරන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.
- මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ අයැදුම්කරු සපයන තොරතුරු අදාළ විදේශ මාධ්‍ය ආයතනය වෙතින් තවදුරටත් තහවුරු කර ගැනීමෙන් අනතුරුවය.
- අයැදුම්කරු තම මාධ්‍ය ආයතනයේ සේවය කරන බවට විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි/ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- විදේශ මාධ්‍යවේදී හැඳුනුම්පත් ලබාගැනීම පිණිස ඉදිරිපත් කෙරෙන යම් අයැදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කරගැනීම අවශ්‍ය බවට හැඟීයන අවස්ථාවන්හිදී, එම අයැදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, අවශ්‍ය වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව තීරණය කෙරේ.

xii. 2022 වසර තුළ නිකුත් කරනු ලබන මාධ්‍ය හැඳුනුම්පත් වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින අවසන් වේ.

**02. මාධ්‍ය හැඳුනුම්පත් වර්ගීකරණය - මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපි ලේඛන**

(i.) මාණ්ඩලික මාධ්‍යවේදී **(Journalist)**

මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් මාධ්‍ය ක්ෂේත්‍රයේ ආයතනගතව සේවය කරන මාණ්ඩලික මාධ්‍යවේදීන්ට මාධ්‍යවේදී (Journalist) හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ. මාධ්‍යවේදී හැඳුනුම්පත අයැදුම් කරන්නන් ඉහත අංක 01 හි i සිට xi දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. පුවත්පත්, වාර සඟරා, ගුවන් විදුලි, රූපවාහිනී, වෙබ් හා විදේශ මාධ්‍ය ආයතනවල ආයතනගත/මාණ්ඩලික මාධ්‍යවේදී හු මෙම කාණ්ඩයට අයත් වෙති.

(ii.) ප්‍රාදේශීය මාධ්‍යවේදී **(Provincial Journalist)**

- ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාම ලේඛනය අදාළ මාධ්‍ය ආයතනය විසින් දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන්ව පහත සඳහන් තොරතුරු සමග රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ). ප්‍රාදේශීය මාධ්‍යවේදියාගේ නම ;
(ආ). ජාතික හැඳුනුම්පත් අංකය ;
(ඇ). ස්ථිර ලිපිනය ;
(ඈ). වාර්තාකරු ආවරණය කරන දිස්ත්‍රික්කය හා ප්‍රදේශය ;
(ඉ). මාධ්‍යවේදියාගේ දුරකථන අංකය/අංක ;

- තම ආයතනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ගේ නාමලේඛනය, මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන ප්‍රවෘත්ති සංස්කාරක/ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක/ප්‍රධාන කර්තෘ/ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘ විසින් නම, තනතුර, අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. නාම ලේඛනයේ සෑම පිටුවකම නාමලේඛනය සහතික කරන තැනැත්තා විසින් තම අත්සන හා නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.
- නාම ලේඛනයේ මුල්පිටපත හා මෘදු පිටපත (Soft Copy) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැළැස්විය යුතුය. මෘදු පිටපත media.accre@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය.
- අයැදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස 06ක කාලයක් ඇතුළත ලබාගත් අඟල් 1x1 1/2 (සෙ.මී. 2.6 x සෙ.මී. 3.7) ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. නියමිත ප්‍රමාණයට නැති හා අපැහැදිලි ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අයැදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබීම අනිවාර්ය වේ.

- අයැදුම් පත්‍රය සමග ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/වලංගු රියැදුරු බලපත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක් එවිය යුතුය. අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- දැනට ප්‍රවෘත්ති සපයන සක්‍රීය වාර්තාකරුවන්ගේ නම් පමණක් නාමලේඛනයට ඇතුළත් කරන ලෙස මාධ්‍ය ආයතන ප්‍රධානින්/ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
- අයැදුම්පත් www.dgi.gov.lk හෝ www.news.lk යන වෙබ් අඩවි වලින් බාගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයැදුම්පත් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්මේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.
- අයැදුම්පත් බහා එවන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ප්‍රාදේශීය මාධ්‍යවේදී හැඳුනුම්පත"යනුවෙන් සඳහන් කළ යුතුය.

(iii.) නිදහස් මාධ්‍යවේදී (Freelance Journalist)

- අවම වශයෙන් වසරක කාලයක් අඛණ්ඩව නිදහස් මාධ්‍යවේදියකු ලෙස ජාතික මට්ටමින් පිළිගත් මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් මාධ්‍ය ආයතනයක සේවය කර තිබිය යුතු අතර, ඒ බව තහවුරු කිරීමට පහත සඳහන් නියමයන් සපුරාලිය යුතුය.
- අයැදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස හයක කාලයක් ඇතුළත තම නමින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා/විශේෂාංග/විචිත්‍රාංග/ඡායාරූප ආදිය අවම වශයෙන් දොළහකට නොඅඩු සංඛ්‍යාවක සහතික කරන ලද ඡායා පිටපත් හෝ සංයුක්ත තැටි හෝ ඉදිරිපත් කළ යුතුය.
- නිදහස් මාධ්‍යවේදී හැඳුනුම්පත ලබා ගැනීමට කරන ඉල්ලීම සමග තමා විසින් ප්‍රවෘත්ති, විශේෂාංග ලිපි, කාලීන වැඩසටහන් සපයනු ලබන මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් මාධ්‍ය ආයතන අතුරින් අවම වශයෙන් එක් ආයතනයකින් හෝ එකී මාධ්‍ය ආයතනය වෙත අඛණ්ඩව පුවත් හෝ වැඩසටහන් හෝ සපයන බවට එම ආයතනයේ ලිපි ශීර්ෂයක ලියූ සහතිකයක් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. එය මාධ්‍ය ආයතන ප්‍රධානියා/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක විසින් නම, අත්සන සමග නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය.

(iv.) විදේශීය මාධ්‍යවේදී - තාවකාලික **(Foreign Journalist -Temporary)**

- ප්‍රවෘත්ති හා කාලීන වැදගත්කමක් ඇති විශේෂ අවස්ථා ආවරණය, ලිපි සම්පාදනය සහ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුත් වාර්තා වැඩසටහන් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන්ට ''විදේශීය මාධ්‍යවේදී - තාවකාලික''. මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.
- අයැදුම්කරු තම මාධ්‍ය ආයතනයේ සේවය කරන බවට විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය ඉදිරිපත් කළ යුතුය.
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත ලිපිය ඉදිරිපත් කළ යුතුය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.
- මාස 06 ක් ඇතුළත ලබාගත් අඟල් 1X1 1/2 (සෙ.මී. 2.6 x සෙ.මී. 3.7) ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළයුතු අතර, ඉන් එක් ඡායාරූපයක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබිය යුතුය.
- විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය මේ සඳහා පිළිනොගැනේ.

(v.) මාධ්‍ය පරිපාලක **(Media Administrator)**

- ජාතික මට්ටමින් පිළිගත් මාධ්‍ය ආයතනයක මාධ්‍ය පරිපාලනයට සෘජුවම දායකවන මාධ්‍ය පරිපාලකයන් සඳහා උපරිම වශයෙන් එක් මාධ්‍ය ආයතනයක තිදෙනකු සඳහා පමණක් මාධ්‍ය පරිපාලක හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.
- මාධ්‍ය ආයතනවල අලෙවි ප්‍රවර්ධන අධ්‍යක්ෂවරුන්/කළමනාකරුවන්/සුබසාධක නිලධාරින් හෝ අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ නිරත වෙනත් නිලධාරීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

(vi.) තාක්ෂණික ශිල්පී **(Technical)**

- ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ කාර්යයෙහි සෘජුවම නිරතවන විද්‍යුත් මාධ්‍ය තාක්ෂණික ශිල්පීන්ට තාක්ෂණික ශිල්පී හැඳුනුම්පත නිකුත් කෙරේ.

- ඉහත අංක 01 යටතේ සඳහන් සියලු කොන්දේසි මාධ්‍ය තාක්ෂණික ශිල්පී හැඳුනුම්පත් සඳහා අයැදුම්කරන්නන් විසින් සම්පූර්ණ කළ යුතුය.

(vii.) රාජ්‍ය මාධ්‍ය නිලධාරී **(Media official)**

- රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ ව්‍යවස්ථාපිත ආයතනවල සෘජුවම මාධ්‍ය තනතුරු සඳහා නිලපත්වීම් සහිත මාධ්‍ය ලේකම්/මාධ්‍ය අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති නිලධාරී/මාධ්‍ය නිලධාරී/ඡායාරූප ශිල්පී/වීඩියෝ කැමරා ශිල්පී/මාධ්‍ය සහකාර යනාදි තනතුරු සඳහා නියමිත වර්ගීකරණයෙන් යුත් හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.
- අමාත්‍යාංශයේ ලේකම් හෝ අතිරේක ලේකම් විසින් තම අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයේ මාධ්‍ය රාජකාරිවල නිරත ඉහත තනතුරු දරන නිලධාරීන්ට හැඳුනුම්පත ලබා ගැනීම සඳහා ඔවුන්ගේ නම් සහ තනතුර සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ පූර්ණ වගකීම නාම ලේඛනය සහතික කරනු ලබන අමාත්‍යාංශ ලේකම්/අතිරේක ලේකම් වෙත පැවරේ.
- ඉල්ලීම් ලිපිය අදාළ රාජ්‍ය ආයතනයේ ආයතනික ලිපිගොනු අංකය සහිතව ඉදිරිපත් කළ යුතු අතර එසේ නැතිව කරන ඉල්ලීම් ලිපි ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- රජයේ ආයතන මාධ්‍ය ඒකකවල සේවය කළද ඉහත තනතුරු හැර වෙනත් තනතුරු දරන්නන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.
- අමාත්‍යාංශයකට අයත් අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක මාධ්‍ය ඒකක සඳහා මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කිරීමේ දී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/සාමාන්‍යාධිකාරී විසින් නාම ලේඛනය හා අයැදුම් පත්‍රය ස්වකීය නම, තනතුර හා නිලමුද්‍රාව සහිතව සහතික කළ යුතුය.

(viiii.) මාධ්‍ය සේවා **(Media Services)**

- මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශවල නියමය අනුව ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ සඳහා සෘජුවම අවශ්‍ය මාධ්‍ය රාජකාරිවලට අදාළ තනතුරු දරන්නන් වෙනුවෙන් මාධ්‍ය සේවා හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.
- මාධ්‍ය සේවා හැඳුනුම්පත් සඳහා අයැදුම්කරුවන් විසින් ඉහත අංක 01 යටතේ සඳහන් සියලු කොන්දේසි සම්පූර්ණ කළ යුතුය.

**පොදු කොන්දේසි**

01. 2022/2023/2024 තෙවර්ෂය වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අයැදුම්පත් භාරගැනීම 2022 මාර්තු 31 දින අවසන් කෙරේ. ඉන්පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
02. මාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 03 ක්, ද්වි මාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 02ක් හා ත්‍රෛමාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 01 ක් නිකුත් කරනු ලැබේ.
03. සය මාසික හෝ වාර්ෂික වාර සඟරා/ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.
04. ප්‍රස්තුත සඟරාව/ප්‍රකාශනය අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන බව තහවුරු කරනු පිණිස මෑතකදී නොකඩවා පළ කරන ලද සඟරාවේ/ප්‍රකාශනයේ මාස 06 ක පිටපත් සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
05. සෑම සඟරාවක් /ප්‍රකාශනයක් සඳහාම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
06. යම් පුවත්පතක් සමග ප්‍රකාශයට පත් කෙරෙන අතිරේක වෙනම පුවත්පතක් ලෙස නොසැළකේ. එවැනි අතිරේක වෙනුවෙන් හැඳුනුම්පත් අයැදුම් කරන මාධ්‍යවේදීන් වෙත ප්‍රධාන පුවත්පත නමින් පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.
07. මාධ්‍ය ආයතනයක සේවයෙන් ඉවත් කරනු ලබන/ඉවත්ව යන මාධ්‍ය වේදියකුගේ හැඳුනුම්පත ආපසු කැඳවා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදීම මාධ්‍ය ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේය. භාර දීමෙන් තොරව ඒ වෙනුවට වෙනත් තැනැත්තකු වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

එවැනි මාධ්‍යවේදියෙකු/වෘත්තිකයකු සිය මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර නොදී වෙනත් මාධ්‍ය ආයතනයක නමින් හැඳුනුම්පතක් අයැදුම් කළද නව හැඳුනුම්පතක් නිකුත් නොකෙරේ.

08. අස්ථානගත වූ මාධ්‍ය හැඳුනුම්පතක් වෙනුවට නැවත හැඳුනුම්පතක් අයැදුම් කරන විට අස්ථානගත වීම පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව පොලිස් ස්ථානය විසින් නිකුත් කරනු ලබන වාර්තාවේ සහතික කරන ලද මුල් පිටපත සමග මාධ්‍ය හැඳුනුම්පතක් නැවත ලබා දෙන ලෙස සේවය කරන ආයතනය මගින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

09. මාධ්‍ය හැඳුනුම්පත මාධ්‍ය කාර්යයන් සඳහා පමණක් භාවිත කළ යුතුය. අවභාවිතය හෝ ජනමාධ්‍ය ආචාරධර්මවලට පටහැනිව ක්‍රියාකිරීම් වාර්තා වුවහොත් මාධ්‍ය හැඳුනුම්පත අවලංගු කිරීමේ හෝ මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදෙන ලෙස නියෝග කිරීමේ හෝ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

10. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ තෙවර්ෂයකට වරක් පමණි. ආයතන විසින් වරින්වර කරන ඉල්ලීම් සලකා නොලබන අතර එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ගෞරව නාම හා අධ්‍යාපන සුදුසුකම් මාධ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් නොකෙරේ. හැඳුනුම්පතෙහි සඳහන් කරනුයේ මාධ්‍යවේදියා ගේ නම සහ වෘත්තීය තොරතුරු පමණි.

12. කේබල් රූපවාහිනී ආයතන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සලකා බැලීමට නම් එම රූපවාහිනී නාලිකාව ඔස්සේ අඩුම වශයෙන් සතියකට ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් 05ක් හෝ විකාශනය කර තිබිය යුතුය. මේ කොන්දේසිය සපුරන කේබල් රූපවාහිනී ආයතනවල ප්‍රවෘත්ති අංශය සඳහා පමණක් උපරිමය 10කට යටත්ව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ. එසේ මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කේබල් රූපවාහිනී සේවා සඳහා නිකුත් කරන බලපත්‍රයෙහි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

13. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ අවසාන තීරණය සේම ඉහත කොන්දේසි හා අවශ්‍යතා කාලීන වශයෙන් වෙනස් කිරීමේ බලයද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

14. පහත සඳහන් ක්ෂේත්‍ර, තැනැත්තන් හා ආයතන වෙත මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.
   i. සිනමා / ටෙලි නාට්‍ය / වේදිකා නාට්‍ය වැනි ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රවල නිරත ශිල්පීන්.
   ii. ප්‍රචාරක හා වෙළෙඳ දැන්වීම් ආයතන හා වීඩියෝ නිෂ්පාදන ආයතන.
   iii. අන්වර්ථ නාම යටතේ ප්‍රවෘත්ති / විශේෂාංග / වැඩසටහන් රචනා කරන ජනමාධ්‍යවේදීන් සඳහා අන්වර්ථ නාමයන් ගෙන්.
   iv. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා නොකරන මාධ්‍ය ආයතන.
   v. විවිධ විෂයය ක්ෂේත්‍රවල පළ කෙරෙන අත් පොත් (Guide Books) හෝ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු වලින් බැහැර ප්‍රකාශන.
   vi. කළමනාකාර සහකාර / සම්බන්ධීකාරක වැනි සෘජුවම මාධ්‍යවේදයට අදාළ නොවන තනතුරු දරන්නන්.
   vii. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය අනුබද්ධිත ආයතන ඇතුලු කිසිදු රාජ්‍ය ආයතනයක ආයතනික වෙබ් අඩවි.

15. පෞද්ගලික අභිමතාර්ථ සාධනය පිණිස මාධ්‍ය හැඳුනුම්පත් අවභාවිතය පිළිබඳ පැමිණිලි ලදහොත් විමර්ශනය කර අදාළ මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය හැඳුනුම්පත් අවලංගු කිරීමේ පූර්ණ බලය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

**මොහාන් සමරනායක,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2021 දෙසැම්බර් මස 21 වැනි දින.

EOG 12 - 0221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.